SC

# ශ්‍රී ලංකා අධිකරණයේ නඩු පමාවීම පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක්

( පුත්තලම දිසා හා මහේස්ත්‍රාත් අධිකරණය ඇසුරින් )

**විභාග අංකය (FGS/S/MSSc/2004/05)**


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 656 |
| වර්ග අංකය | |



සමාජ විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්ව විද්‍යාලය
කැලණිය.

# නිබන්ධන සාරාංශය

ශ්‍රී ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රයේ නඩු පමාව පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රයක් ලෙස සඳහන් මෙම නිබන්ධයේ පළමු පරිච්ඡේදය තුළදී මාතෘකාව හඳුන්වාදීම සිදුකල අතර එහිදි මෙය කොතෙක් දුරට සමාජානුබද්ධ වන්නේ ද යන්න විග්‍රහ කරන ලදි. එහිදී නීතිය යන්න නිර්වචනය කරමින් නීතිය, අධිකරණය, සමාජය හා සම්බන්ධවන අකාරය විමසන ලදි. මෙහිදී අධ්‍යයන ගැටලුවේ ඇති වැදගත්කම මෙන්ම වෙනත් ගැටළු වලින් වෙනස්වන අකාරයත්, අධ්‍යයන හා සමගාමී වන මුඛ්‍ය පරමාර්ථය වන අධිකරණ නඩු පමා වන්නේ ඇයි යන්න හා සමගාමී වන අරමුණුද විග්‍රහ කරන ලදි. අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් පුත්තලම දිසා හා මහේස්ත්‍රාත් අධිකරණය තෝරාගැනීමට හේතුව හා එහිදි භාවිතා කරන නියැදිය පිළිබඳ දක්වන ලදි. අධ්‍යයනයට අනුකූලව ක්‍රමවේදය වශයෙන් කෘත්‍යවාදය තෝරා ගන්නා ලදි. එසේම භාවිතා කල ක්‍රමවේද වන්නේ සංඛ්‍යාත්මක ක්‍රමවේදය, තුලනාත්මක ක්‍රම වේදය හා ඓතිහාසික ක්‍රමවේදයයි. අධ්‍යයනයට අදාලව දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රමය ලෙස යොදා ගනු ලැබුවේ නිරීක්ෂණය හා ව්‍යුහගත නොවූ සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි.

පරිච්ඡේද විකාශනය යටතේ පළමුවන පරිච්ඡේදය තුල අධ්‍යයන පිළිබඳ හැඳින්වීමත් දෙවන පරිච්ඡේද යටතේ ශ්‍රී ලංකා අධිකරණ ක්ෂේත්‍රයේ ඉතිහාසයත් තුන්වන පරිච්ඡේදය යටතේ අධිකරණ ව්‍යුහ හා බලතල විග්‍රහ කිරීමත් හතරවන පරිච්ඡේදය යටතේ පුත්තලම දිසා හා මහේස්ත්‍රාත් අධිකරණ ඇසුරින් නඩු පමාවන අයුරුත් පස්වන පරිච්ඡේදය යටතේ අධ්‍යයනට අදාලව නිගමන හා සමාලෝචන විග්‍රහ කරමින් පළමු පරිච්ඡේදය තුලින් මෙම පර්යේෂණයේ ඉදිරි සැලස්ම ඉදිරිපත් කරන ලදි.

මෙම පර්යේෂණයේදී ශ්‍රී ලංකා අධිකරණ ක්ෂේත්‍ර ඉතිහාසයේ විග්‍රහ කිරීම තුලින් සමස්ත අධිකරණ ක්ෂේත්‍රයේ ඉතිහාසය විග්‍රහ කරලීමට උත්සාහ ගතිමි. ඒ යටතේ රාද්වෑන් යුස්තති, ලෑන්රාද්, සිවිල්රාද් උසාවි පිළිබඳ මෙන්ම ශ්‍රී ලංකාවේ වර්තමාන උසාවි පිළිබඳවද සාකච්ඡා කරන ලදි. එමෙන්ම තුන්වන පරිච්ඡේද යටතේ අධිකරණයේ බලතල හා ව්‍යුහය පිළිබඳ විග්‍රහ කිරීමත් සිදුකරන ලද අතර එහිදී නව අධිකරණ ව්‍යුවහය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය අභියාචනා අධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය හා ප්‍රාථමික අධිකරණය පිළිබඳ සාකච්ඡා කරනු ලැබීය. එයට අමතරව මෙහිදි අධිකරණ භාෂාව පිළිබඳවත් වෙනත් රටවල අධිකරණ පිළිබඳවත් සාකච්ඡා කරන ලදි. වෙනත් රටවල අධිකරණ යටතේ ඇමරිකානු අධිකරණයේ ස්වරූපයත් එහි ශ්‍රේෂ්ඨාධිකරණයේ දිසා අධිකරණයේ බලය විග්‍රහ කරන ලදි. ඔස්ට්‍රේලියාව, කැනඩාව, ජපානය, ස්විට්සර්ලන්තය ආදී රටවල අධිකරණයන්හි ස්වරූපය මෙහිදී විද්‍යාත්මකව සලකා බැලීම සිදු කරන ලදි.

අධ්‍යයනයේ වැදගත්ම පරිච්ඡේදය වන පුත්තලම දිසා හා මහේස්ත්‍රාත් අධිකරණය ඇසුරින් නඩු පමා වන අයුරු විමසීම මෙහිදී සිදුවන අතර එහි දී පුත්තලම දිසා හා මහේස්ත්‍රාත් අධිකරණය හඳුනා ගැනීමත් සිවිල් නඩු හා අපරාධ නඩු ආශ්‍රයෙන් කොතෙක් දුරට නඩු පමා වන්නේ ද යන්නත් විමසා බලන ලදි. මෙම නඩුපමාව පිළිබඳ මහජන අදහස්, කාර්යමණ්ඩල අදහස්, නීතිඥ පිරිසගේ අදහස්,හා  අධිකරණයට සම්බන්ධ වන වෙනත් නිළධාරීන්ගේ අදහස් විද්‍යාත්මකව විග්‍රහ කරමින් සැබවින්ම අධිකරණයේ නඩු පමාව සිදුවන්නේ ද හා නඩු පමාව ඔස්සේ සමාජයට කෙබඳු බලපෑමක් කරන්නේද යන්නත් විමසන ලදි.

පස්වන පරිච්ඡේදය යටතේ නිබන්ධයට අදාලව සමාලෝචනය ඉදිරිපත් කරමින් නඩු පමාව සඳහා පොලිසිය, බන්ධනාගාරය මෙන්ම අධිකරණය තුලින් සිදුවන මෙම නඩු පමාව

පැහැදිලිවම පෙනී ගිය අතර ඒ සඳහා පොලිසිය තුලින් සිදුවන අඩුපාඩු සඳහා දිය හැකි විසදුම් මෙන්ම අධිකරණය, බන්ධනාගාරය තුලින් සිදුවන අඩුපාඩු අවම කරගැනීම සඳහා කල යුතු යෝජනා ඉදිරිපත් කරමින් මෙම සමාජයට දිය හැකි, එනම් මුඛ්‍ය ගැටලු වට දිය හැකි අවසන් නිගමනය ලබාදෙන ලදි. සමාජ ව්‍යුහයේ පවතින සමාජ සංස්ථාවක් වන නීතිය යන සමාජ සංස්ථාවහි  නඩු පමාවීම සෙසු සමාජ සංස්ථාවන්හි කෘත්‍ය සඳහා බලපාන බැවින් එහි නඩු පමාවීම කඩිනම් කිරීම මගින් නීතිය යන සමාජ සංස්ථාව ආරක්ෂාවේ.මෙහිදී සමාජයේ නඩු පමා වීම නැමැති ගැටළුවට ස්ථිරසාර විසඳුමක් ලැබෙන බවත් එය මහ සමාජයට වඩාත් යහපත් ක්‍රියාදාමයක් වන බවත් අවසන් ලෙස නිගමනය කළෙමි. මෙහිදී උපග්‍රන්ථ යටතේ ලංකාවේ අධිකරණ ක්‍රමයට අදාල විශේෂ පර්ෂද කිහිපයක් විස්තර කල අතර මෙම පර්යේෂණ නිබන්ධනයට අදාල වන ගෝත්‍රිකයුගය අධිකරණ පිළිබඳවත් භාවිතාවන වචන මාලාවත්, බන්ධනාගාරය, පොලිසිය සම්බන්ධ මහසමාජයට එකතු වීඇති වචන වල එකතුවත් සම්බන්ධ කරමින් උත්සුක වූයේ මෙම පරියේෂණයේ ගුණාත්මක බව වැඩිකරලීමටය.

ඇමුණුම් ලෙස රඳවා තැබීමේ බලපත්‍රය සාක්ෂිකරුවෙකුට යැවෙන සිතාසිය,බන්ධනාගාර ගත කිරීමේ වරෙන්තුව, චූදිතයෙකුට යැවෙන සිතාසිය . සිතාසි භාරදීමේ දිවුරුම් පත්‍රය ,යන ඇමුණුම් තුලින්ද මෙම පර්යේෂණයට අදාලව ගුණාත්මක භාවය වැඩිකරලීමට බලාපොරොත්තු විය. කෙසේ වූවද අවසානයේ බලාපොරොත්තු වූයේ අධිකරණයේ නඩු පමා වීම් පිළිබඳ ගැටලුවට සමාජ විද්‍යානුකූලව සාර්ථක විසඳුමක් ලබා දීමටය.